## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------**

**1.6.1** **ආදායම් ලැබීම්**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විදේශ ධූත මණ්ඩල ගමන් බලපත්‍ර සම්බන්ධ මුළු ආදායම පරිගණක පද්ධතියේ නිවැරදිව යාවත්කාලීන නොවන අතර එම ආදායම හැර මුදල් පොතට අනුව ගමන් බලපත්‍ර අංශයේ මුළු ආදායම හා දෙපාර්තමේන්තුවේ සමස්ථ ආදායම් වාර්තාව සැසඳීමේදී මාස 05 ක එකතුවෙහි රු.1,051,200ක වෙනසක් නිරීක්ෂණය විය. | ගෙවීම්ලාභියා සෘජුවම බැංකුවට ගෙවනු ලබන ගාස්තු පරිඝණක ගත ආදායමට එකතු නොවේ. බැංකු සාරාංශය මඟින් දෙපාර්තමේන්තු ගිණුමේ සටහන් කරයි. | ආදායම නිවැරදිව ගිණුම් ගත කිරීම. |

1.6.2 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂය රු.162,416,726 ක් වුව ද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු ශේෂය රු.161,935,932 ක් වූ බැවින් ලැබිය යුතු ශේෂය රු. 480,794 ක වෙනසක් නිරීක්ෂණය විය. 2019 වර්ෂයේදී ද මෙම වෙනස පිළිබඳ විගණකාධිපති විසින් වාර්තා කලද මේ දක්වා නිවරදි කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස 2018 වර්ෂයට පෙර වර්ෂ කිහිපයක සිට පවතින්නක් වන අතර එම වෙනසට හේතු පැරණි ලේඛන පරීක්ෂා කර අනාවරණය කර නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමේ කටයුතු කඩිනම් කිරීම. |

## 1.6.3 දේපල පිරියත හා උපකරණ

----------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 8.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පරිගණක ලේඛනයේ මූල්‍ය නොවන වත්කම් වල ආරම්භක ශේෂයන් හා වර්ෂය තුළ මිලදී ගැනීම් ඇතුළත් කර නොතිබුණි. | **CIGAS** පරිගණක මෘදුකාංග මඟින් ලබාගත් ස්ථාවර වත්කම් ලේඛනයේ අවශ්‍ය දත්ත ඇතුලත් වී තිබීම. | චක්‍රලේඛ උපදෙස් පරිදි මූල්‍ය නොවන වත්කම් පරිගණක ලේඛනය සකස් කිරිම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු.404,759,071 ක් වුවද යථෝක්ත පරිගණක ලේඛනයේ එම අගය රු. 405,030,372 ක් වූ බැවින් රු. 271,301 ක වෙනසක් නිරීක්ෂණය විය. | රු.271,301ක පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණයක් වැරදීමකින් පරිගණක මෘදුකාංග මඟින් ලබාගත් යන්ත්‍රෝපකරණ ගිණුමේ ඇතුලත් වී තිබීම. | වෙනස හඳුනා ගැනීම හා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම. |
| (ඇ) | ගොඩනැගිලි හා ඉදිකිරීම් යන්ත්‍ර හා වෙනත් යන්ත්‍රෝපකරණ සහ වෙනත් මූල්‍ය නොවන වත්කම්හි භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂය අතර එකතුව රු. 94,656,090 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තු ගිණුම් සාරාංශ මඟින් වාර්තා නොකරන ලද අගයන් බැර කිරීම. | වෙනසට හේතු සොයා නිවැරදි කිරිම. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පාඩු හා හානි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | හානි හා පාඩු ලේඛනය ඉදිරියේ දි පවත්වාගෙන යාමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය අවසානයේදී රු. 316,922 ක නොපියවූ උප අග්‍රිම ශේෂයක් ගිණුම් වල පැවති අතර භාණ්ඩාගාරයේ පොත් අනුව එම අගය රු.366,133 ක් විය. | 2021 වර්ෂයේ දි භාණ්ඩාගාර පොත් වල නිවැරදිව සටහන් වි ඇත. | වෙනසට හේතු සොයා නිවැරදි කිරිම. |

### 2.2 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූලික ඇස්තමේන්තුගත ආදායම රු.19,615,000,000ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.8,000,000,000ක් විය. සත්‍ය ආදායම රු.5,532,660,511ක් හෙවත් සංශෝධිත ආදායමෙන් සියයට 69ක් විය. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර වෙනස රු.2,467,339,489ක් හෙවත් සියයට 31 ක් බව නිරීක්ෂණය විය. | කොරෝනා වසංගතය හේතුවෙන් රට වසා දැමීම හා නිරෝධායන නීති ක්‍රියාත්මක විම හේතුවෙන් ගමන් බලපත්‍ර, ද්විත්ව පුරවැසි හා වීසා ආදායම අඩුවීම. | ආදායම නිවැරදිව ඇස්තමේන්තු කිරීම. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් සම්පූර්ණ හා නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් මු.රෙ.66 මාරු කිරීම් මඟින් අවස්ථා 04කදී මූලික ඇස්තමේන්තුව සියයට 55 සිට 346 දක්වා වූ පරාසයක් වැඩි කර තිබුණි. | අත්‍යාවශ්‍ය වියදම් සඳහා කොන්දේසි වලට යටත්ව වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කර ඇත. | අවශ්‍යතා හඳුනාගෙන නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයන් 5ක් වෙනුවෙන් වෙන්කල මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 82ක්ම එම වර්ෂයේ අවසාන මාසයේදී වියදම් කර තිබුණු අතර මුල් මාස 11 දීම වියදම් කර තිබුණේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18ක් පමණි. | ප්‍රාග්ධන වියදම් සහිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුවුයේ වර්ෂයේ අවසාන කාර්තුවේය. | කල්වේලා ඇතිව ප්‍රතිපාදන වැයකිරීමට කටයුතු කිරීම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයට අදාලව 2021 මාර්තු දක්වා නිරවුල් කරන ලද එකතුව රු.6,035,178 ක බැරකම් දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයේ දක්වා නොතිබුණි. | බැරකම් නිසි පරිදි හඳුනා නොගැනීම හේතුවෙන් සිදු වී ඇති තත්ත්වය නිවැරදි කිරීමට උපදෙස් දී ඇත. | සියලු බැරකම් අදාල ලේඛනයේ ඇතුලත් කිරීම. |
| (ආ) | වැය විෂයයන් 5ක 2021 වැය ලෙජරයේ සඳහන් බැරකම් වටිනාකම හා ගෙවීම් වවුචර්වල සඳහන් වටිනාකම අතර රු.4,649,937ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 9ක මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් වටිනාකම හා වවුචර් අනුව වටිනාකම අතර රු.10,427,218ක වෙනසක් නිරීක්ෂණය විය. | බැරකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | බැරකම් නිවැරදිව හඳුනා ගැනීම. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය | රු.96,190,676 | 2020 වර්ෂයේදී මිලදීගත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබීම. | CIGAS පරිගණක වැඩසටහන මඟින් අදාල අවස්ථාවන් හී දි සටහන් කර ඇත. | චක්‍රලේඛයේ සඳහන් ආකෘති අනුව ඉදිරිපත් කළයුතු වීම. |

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට ජංගම ගිණුමේ ඩොලර් 700ක නිෂ්කාෂණය නොවූ ලැබීම් පැවතුණු අතර වර්ෂ අවසානයේ පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල ගුවන් තොටුපලේ සරප් වෙත ඩොලර් ගනුදෙනු සඳහා ලබා දී ඇති අතුරු අග්‍රිමයකි | නිවැරදි ගිණුම්කරන දත්ත පවත්වා ගැනීම හා විගණනය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගොපදේශ අංක 12 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා අනුමත ආදායම් එකතු කිරීමේ සැලැස්ම, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2020 ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත වී නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ඉදිරියට චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | ආදායම් එකතු කිරීමේ සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කිරීම |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

-------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව "වීසා ස්ටිකර්" මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන10ක් වෙන්කර තිබුණද 2020 වර්ෂය අවසානය දක්වා එම කාර්යය ආරම්භ කර නොතිබුණි. | කොවිඩ් වසංගතය නිසා "වීසා ස්ටිකර්" මිලදි ගැනීමේ අවශ්‍යතාවය ඇති නොවීය. | අවස්ථානුකූලව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 වෙනත් නිරීක්ෂණ

------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැය ලෙජරයේ ජ'නල් සටහන් මගින් මාරු කිරීම් හා අධිහාර ගිණුම් තැබීම් පැහැදිලිව හඳුනා ගැනීමට නොහැකි වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන තුළ අධිහාර ලෙස සටහන් කල අගය හා වැය ලෙජරය තුළ අධිහාර ලෙස සටහන් කල අගයන් අතර වෙනස්කම්ද නිරීක්ෂණය විය. | වැය ලෙජරය නාමිකව පවත්වාගෙන යයි. එය හැකිතාක් නිවැරදිව පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත. | අධිහාර නිවැරදිව ගිණුම්ගත කිරීම |

## 3.4 ප්‍රසම්පාදනයන්

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛ අංක 08 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 13හි ආකෘතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන දිනයන් සඳහන් කර නොතිබුණු අතර සවිස්තර ප්‍රසම්පාදන සැලැස්මද සකස් කර නොතිබුණි. | 2021 වර්ෂයේ දී නිවැරදිව සැකසීමට කටයුතු කරනු ලැබේ. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව සැලසුම් සකස් කිරීම. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විදේශ දූත මණ්ඩල අංශය විසින් ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පිළිබඳ ව මෙහෙයුම් අත්පොතක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබූ අතර එහි 8 හා 9 වගන්ති වල සඳහන් පරිදි උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත්, ගමන් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ අමුණා තිබිය යුතුය. එසේ වුවද 2020 වර්ෂයේදී නිකුත් කළ ගමන් බලපත්‍ර 50 කින් 12 කම එම ගමන් බලපත්‍ර සමඟ අදාල ඡායා පිටපත් ඇතුළත් කර නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදි අනාවරණය විය. එසේම මුදල් ගෙවීමේ ලදුපතේ ඡායා පිටපත් ද අදාල ඉල්ලුම් පත්‍රයේ අමුණා නොතිබුණු අතර පරිලෝකනය කල දත්තයන්හි ද එම තොරතුරු ඇතුළත් වී නොතිබුණි. | පෙර ගමන් බලපත්‍රයේ ඡායා පිටපත් හා පරිලෝකනය කරන ලද තොරතුරු පදනම් කරගෙන බලපත්‍ර නිකුත් කරනු ඇත. | අදාල අභ්‍යන්තර පාලන රෙගුලාසි විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම. |
| (ආ) දෙපාර්තමේන්තුවේ සේවය කර මියගිය, වැඩ තහනම් වූ හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 5කට වැඩි කාලයක සිට අයවිය යුතු පිළිවෙලින් රු.54,757ක් රු.72,496ක් හා රු.23,228ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | මෙම ශේෂයන් විශ්‍රාම පාරිතෝෂිකයෙන් හා පෞද්ගලික මුදලින් අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | කාර්යක්ෂමව ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 1292ක්ද තත්‍ය කාර්යමණ්ඩලය 1040ක්ද වූ අතර පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩලය පිළිවෙලින් 253ක් හා 01ක් විය. | 2021 ඔක්තෝබර් 01 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 272ක් වන අතර අතිරික්ත සංවර්ධන නිලධාරි දෙදෙනෙකු සිටියි. | කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කිරීම. |